# ඌව පළාත් රාජ්‍ය සේවයේ සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ රියදුරන්

## සඳහා රියදුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහය

01. සංයුතිය

1.1 ඌව පළාත් රාජ්‍ය සේවයේ සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ රියදුරන් සඳහා වන රියදුරු සේවයේ සංයුතිය පහත දැක්වෙන පරිදි වේ.

(අ) II වන පන්තියට කෙළින්ම බඳවා ගනු ලබන අය

(ආ) I වන පන්තියට උසස් කරනු ලබන අය

02. සේවක සංඛ්‍යාව

සේවක සංඛ්‍යාව, වාර්ෂික ඇස්තමේන්තුවල ඒ ඒ ශීර්ෂයන් හා සම්මතය යටතේ දක්වනු ලබන අතර, පළාත් සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ රියදුරු සේවයේ මුළු සේවක සංඛ්‍යාව (භාණ්ඩාගාරයේ) අයවැය අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත කර ඇති මුළු රියදුරු සේවක සංඛ්‍යාව නොඉක්මවනු ඇත.

03. වාර්ෂික ඒකාබද්ධ වැටුප් පරිමාණය

I පන්තිය - රු. 103380-9x1320-8x1560-127740/-
(රු. 107340/- ට පෙර කාර්යක්ෂමතා කඩඉමකි)

II පන්තිය - රු. 85260-14x1320-6x1560-113100/-
(රු. 89220/- ට පෙර කාර්යක්ෂමතා කඩඉමකි)

04. පාලනය

4.1 සේවය ඌව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ පාලනයට යටත්වනු ඇත.

05. බඳවා ගැනීමේ ක්‍රමය

5.1 බඳවා ගැනීමේ දී රජයේ ගැසට් පත්‍රය මඟින් හෝ ප්‍රසිද්ධ දැන්වීමක් මඟින් හෝ වෙනත් සුදුසු ආකාරයකින් ඉල්ලුම්පත් කැඳවිය යුතුය. අයදුම්කරුවන් ලිඛිත පරීක්ෂණයකට පෙනී සිටිය

යුතු අතර, ඒදිනට පවතින පුරප්පාඩු සංඛ්‍යාව පදනම් කරගෙන උපරිම ලකුණු ලබාගන්නා අය සම්මුඛ පරීක්ෂණයකට භාජනය කිරීමෙන් අනතුරුව විධිමත් ප්‍රායෝගික පරීක්ෂණයකටද භාජනය කර ඉන් සමත් වන අය බඳවා ගැනීමට කටයුතු කරනු ලැබේ.

06. බඳවා ගැනීමේ සුදුසුකම්

II පන්තියේ රියදුරන් බඳවා ගැනීම

6.1 ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතුය. අයදුම්කරුවන් අයදුම්පත් කැඳවන දිනට ඌව පළාත තුළ අවම වශයෙන් වසර තුනක ස්ථිර පදිංචියක් තිබිය යුතුය.

6.2 තනතුර සඳහා ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසාන දිනයට වයස අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. රජයේ හා පළාත් රාජ්‍ය සේවයේ යෙදී සිටින අය සම්බන්ධයෙන් උපරිම වයස් සීමාව බලපාන්නේ නොලැබේ.

6.3 අ.පො.ස.(සා.පෙළ) විභාගයේ දෙවරකට නොවැඩි වාර ගණනකදී ගණිතය, භාෂාව ඇතුළු විෂයයන් 06 කින් සමත් වී සිටිය යුතුය.

6.4 පෞද්ගලික/කුලීරථ සහ භාර බර හොණ්ඩර 34 දක්වා ස්ටේෂන් වැගන් රථ, මෝටර් කෝච්, බස්රථ පැදවීම පිළිබඳව මෝටර් රථ කොමසාරිස්වරයා විසින් නියම කරන ලද නිපුණත්වය පිළිබඳ සහතිකය ලබා තිබිය යුතුය. බඳවා ගන්නා දිනට වසර 05 කට පෙර අදා[illegible] සහතිකය ලබා තිබිය යුතුය.

6.5 වාහන රියදුරෙකු වශයෙන් වසර පහක පළපුරුද්දක් තිබිය යුතුය. (සහතික මඟින් සනාථ කළ යුතුය)

6.6 අවම උස අඩි 5 අඟල් 2 1/2 ක් විය යුතුය.

6.7 දිවා කාලයේ සහ රාත්‍රී කාලයේ දී සේවයේ යෙදීම පිණිස ශාරීරික වශයෙන් සුදුසු තත්ත්වයක සිටිය යුතු අතර, මනා ඇස් පෙනීමක් තිබිය යුතුය.

6.8 මහා මාර්ග නීති සංග්‍රහය පිළිබඳ මනා දැනුමක් තිබිය යුතුය.

07. පළමුවන පන්තියට උසස් කිරීම

7.(I) පරිවාස කාලය අවසානයේ සේවය ස්ථිර කර තිබිය යුතුය.

(II) II පන්තියේ වසර 10 ක සේවා කාලයක් තිබිය යුතුය.

(III) උසස්වීම් ලබන දිනට පූර්වාසන්න පස් අවුරුද්ද තුළ සතුටුදායක සේවා කාලයක් තිබිය යුතුය. උසස්වීම් ඉල්ලීම් කරන පූර්වාසන්න දිනට වසර 05 ක කාලය තුළ වරදකට (අවවාද කිරීමක් හැර) දඬුවමක් ලබා නැත්තා වූද සහ සියලු වැටුප් වර්ධක ලබා ඇත්තෙකු විය යුතුය.

(IV) අදාළ කාර්යක්ෂමතා කඩඉම් සමත්ව තිබිය යුතුය.

(V) භාර බර හොන්ඩර 34 ට වැඩි බර මෝටර් වාහන සහ බර ට්‍රේලර් සහ මගීන් 32 ට වඩා ගෙන යා හැකි බලපත්‍ර ලබා ඇති මෝටර් කෝච් පැදවීම සඳහා මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් වරයා විසින් නියම කරන ලද නිපුනතාවය පිළිබඳ සහතිකයක් ලබා තිබිය යුතුය. (ඒ පන්තිය)

7.2 ඉහත කොන්දේසි සපුරන රියදුරන් පිළිබඳ දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශ ලැබීමෙන් පසු ඌව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සුදුස්සන් පත් කරනු ලැබේ.

7.3 උසස්වීම් සඳහා මෙයට අමතරව ආයතන සංග්‍රහයේ අනෙකුත් විධිවිධාන බල පැවැත්වෙනු ඇත.

08. කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය

8.1 පහත සඳහන් නිලධාරීන්ගෙන් යුත් සම්මුඛ/ප්‍රායෝගික පරීක්ෂණ මණ්ඩලයක් මගින් කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ පැවැත්විය යුතුය.

1. ඌව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් හෝ ඔහුගේ නියෝජිතයෙක්.
2. මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් දෙපාර්තමේන්තුවේ මෝටර් රථ වාහන පරීක්ෂකයෙකු/යාන්ත්‍රික ඉංජිනේරු.
3. පොලිස් රථ වාහන අංශයේ මූලස්ථාන පොලිස් පරීක්ෂක හෝ ඔහුගේ නියෝජිතයෙකු.

04

8.2 පහත සඳහන් නිර්නායක උපයෝගි කරගත යුතුය

| නිර්නායක | ලකුණු ප්‍රමාණය |
| --- | --- |
| (I) මහාමාර්ග නීති පිළිබඳ ප්‍රායෝගික දැනුම | 40 |
| (II) මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ මූලික දැනුම | 40 |
| (III) පැමිණීම, වැඩ, හැසිරීම | 20 |
| | 100 |

මෙම පරීක්ෂණයෙන් සමත්වීම සඳහා අවම වශයෙන් ලකුණු 40 ක් වත් ලබාගත යුතුය.

8.3 වයස පදනම් කරගෙන කාර්යක්ෂමතා කඩඉම් සමත්වීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කරනු නොලැබේ.

09. සේවයේ නියුක්ත කිරීම

9.1 සියලුම රියදුරන් ස්ථාන මාරු කිරීම් වලට යටත් වේ. ඔවුන් ඌව පළාතේ ඕනෑම සෞඛ්‍ය ආයතනයකට පත්කරනු/ස්ථාන මාරු කරනු ලැබිය හැකිය.

9.2 තනතුර ස්ථිරය. දායක විශ්‍රාම වැටුප් අරමුදල යටතේ දායක විශ්‍රාම වැටුපකට හිමිකම ඇත. විශ්‍රාම වැටුප් හිමිකම ඇති තනතුරකට පත්කර ඇති අයෙකු සම්බන්ධයෙන් 2003.05.05 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ 18 විධිවිධාන අදාළ වේ.

9.3 බඳවා ගැනීමේ පරිපාටි 2004.01.01 දින සිට ක්‍රියාත්මක වනු ඇත.

10. අන්තර්ග්‍රහණය කිරීම.

සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්ගෙන් පත්වීම් ලබා ඇති රියදුරන් සහ දැනට සෞඛ්‍ය ආයතනවල සේවයේ යෙදී සිටින ඌව පළාත් රාජ්‍ය සේවා රියදුරු ව්‍යවස්ථාවට අනුව බඳවා ගත්, එහෙත් නව ව්‍යවස්ථාවට අනුව සුදුසුකම් ලබන රියදුරන් ඔවුන්ගේ මනාපය මත මෙම නව සේවාවට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

/05

11. වෙනත් විධිවිධාන

මෙම ව්‍යවස්ථා සංග්‍රහයේ ඇති විධිවිධාන වලට අමතරව ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ විධිවිධාන වලටද, මුදල් රෙගුලාසි වලටද, දෙපාර්තමේන්තු නියෝග වලටද, රජය විසින් වරින් වර නිකුත් කරනු ලබන වෙනත් විධිවිධාන හා නියෝග වලටද, ඌව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා නියෝග වලටද අනුකූලව ක්‍රියා කිරීමට සියළුම රියදුරන් බැඳී සිටිති.

12. විධිවිධාන සළකා නොමැති කරුණු

මෙම ව්‍යවස්ථා සංග්‍රහයේ දැනට විධිවිධාන සලසා නොමැති කරුණක් සම්බන්ධව තීරණ ගැනීමට අවශ්‍ය වුවහොත් එම බලය ඌව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වන්නේය.

අනුමත කරමි.

..............................
(කේ.එම්.ධර්මරත්න - සභාපති)

..............................
(ඒ.ඒ.සලාම් - සාමාජික)

..............................
(ආර්.ඥාණසේකරන් - සාමාජික)

2004.06.04 දින.

අනුමත කරන ලදී.

සී. නන්ද මැතිව්
ඌව පළාත් ආණ්ඩුකාරවර

අ/- 2005.03.04 වන දින.